

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

புடவைக் கைத்தொழில் திணைக்களம்

DEPARTMENT OF TEXTILE INDUSTRY

වැය ශීර්ෂ අංක: 303

செலவினத் தலைப்ப இலக்கம்: 303

Expenditure Head No: 303

3 වන මහල, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, මාලිගාවත්ත, කොළඹ 10

3ஆம் மாடி,செயலகக் கட்டிடம், மாளிகாவத்தை, கொழும்பு 10

3rd Floor, Secretariat Building, Maligawatta, Colombo 10

අන්තර්ගතය

පරිච්ඡේදය 01: ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03: වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04: කාර්ය සාධන දර්ශකය

පරිච්ඡේදය 05: තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06: මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07: අනුකූලතා වාර්තාව

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය 01 : ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය අනෙකුත් බොහෝ කර්මාන්ත මෙන් එක් ප්‍රදේශයකට පමණක් සීමා නොවී සියලු පළාත්වල පැතිරී ඇති කර්මාන්තයකි. එමෙන්ම අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය ඒ යටතේ ඇති එක් අංශයක් ලෙස හඳුනාගත හැකි අතර සාම්ප්‍රදායික විවීම් ක්‍රමවේද, අනන්‍ය මෝස්තර, රටා ආදියෙන් පොහොසත් වූවකි. වර්තමානයේ 15000 කට අධික පිරිසක් මෙම කර්මාන්තයේ නියැළෙන අතර එමගින් ජනිත වන සෘජු සහ වක්‍ර ආර්ථික ප්‍රතිලාභ ද රාශියකි.

වැඩි වශයෙන් ග්‍රාමීය ප්‍රදේශ කේන්ද්‍ර කොටගෙන ස්ථාපිතව ඇති මෙම කර්මාන්තයේ නියැළෙන බහුතරයක් කාන්තාවන් වන අතර රැකියා උත්පාදනය සහ ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය ඔස්සේ ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්වීම වෙනුවෙන් ප්‍රමුඛ කාර්යයක් ඉටු කරන අංශයකි. පෞද්ගලික අංශය, සමූපාකාර අංශය සහ පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තු යටතේ ඇති විවීම් මධ්‍යස්ථාන මගින් රෙදි ඇතුළු විවිධ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත අයිතම නිෂ්පාදනය කරන අතර අලෙවිසැල් මගින් එම නිෂ්පාදන අලෙවිය සිදු කරනු ලබයි.

පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළව සාම්ප්‍රදායික ශිල්පීය ඥානය මෙන්ම වෘත්තීය පුහුණු පාඨමාලා සහ පුහුණු ආයතන ද මෙරට තිබෙන අතර රෙදිපිළි / විලාසිතා නිර්මාණකරන ක්ෂේත්‍රවලට අදාළ උපාධි පාඨමාලා ද ඇත.

අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය යනු, පරිසර හිතකාමී නිෂ්පාදන ලෙස සහ මෙරටට අනන්‍ය වූ මෝස්තර රටා ඇතුළත් දේශීය වටිනාකම් සහිත නිෂ්පාදන ලෙස සංචාරක කර්මාන්තය සහ විලාසිතා කර්මාන්තය මෙන්ම ඉහළ වටිනාකමක් ඇති දේශීය සහ අපනයන වෙළඳපොළවල් (niche & premium markets) සමග සාර්ථකව ඒකාබද්ධ කළ හැකි වූවකි. එමෙන්ම, පොකුරු කණ්ඩායම් පාදක (cluster based) නිෂ්පාදනය ශක්තිමත් කිරීම, නිෂ්පාදන සැලසුම් සහ නවෝත්පාදනය වැඩි දියුණු කිරීම, ජාතික මට්ටමේ වෙළඳ නාමකරණය (branding) සහ සම්බන්ධීකරණය හරහා වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම මගින් මෙම අංශයට පුළුල් රෙදිපිළි සහ ඇඟලුම් වටිනාකම් දාමයට වඩාත් හොඳින් ඒකාබද්ධ වීමට හැකි වේ.

මෙම ප්‍රවේශය ග්‍රාමීය ආදායම් වැඩි කිරීම, කාන්තා ආර්ථික සවිබලගැන්වීම, ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය සහ අපනයන විවිධාංගීකරණය සඳහා සහාය වන අතර ම මෙරට අද්විතීය සංස්කෘතික අනන්‍යතාවය ද ආරක්ෂා කරයි.

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් මෙම සියලු අංශ සම්බන්ධීකරණය කරමින් මෙරට අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම, නිෂ්පාදන

විවිධාංගීකරණය සහ නිෂ්පාදන සංවර්ධනය සඳහා පර්යේෂණ සිදු කිරීම සහ ක්ෂේත්‍රයට හඳුන්වා දීම, තාක්ෂණික වැඩි දියුණු කිරීම් හඳුන්වා දීම, සාම්ප්‍රදායික දැනුම සංරක්ෂණය, වෙළඳපොළ සම්බන්ධීකරණය, ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය ආදී වැඩසටහන් රාශියක් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ සියලු පළාත් ආවරණය වන පරිදි පිහිටුවා ඇති පේෂ කර්මාන්ත පුහුණු ආයතන මගින් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය කර ගනිමින් 2025 වර්ෂය තුළ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත සංවර්ධනය සඳහා සිදු කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය මෙම වාර්තාවෙහි ඇතුළත් කර ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන් ම දේශීය හා විදේශීය වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරගකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම.

මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම, අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.

අරමුණු

- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සහ උපාය මාර්ගික සැලසුම්කරණය.
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සහ ඇගයීම සඳහා ආයතනික රාමුව ශක්තිමත් කිරීම සහ සම්බන්ධීකරණය.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැළෙන්නන්ගේ ධාරිතා සංවර්ධනය සහ කුසලතා සංවර්ධනය.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය පුහුණුකරුවන් පුහුණු කිරීම.
- ක්ෂේත්‍රය සඳහා නව ශ්‍රමිකයින් පුහුණු කිරීම.
- ක්ෂේත්‍රය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සහ පහසුකම් සැපයීම.
- වෙළෙඳපොළ පුළුල් කිරීම සහ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.
- පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඒකාබද්ධ සංවර්ධනය වෙනුවෙන් ආයතනික සම්බන්ධීකරණය.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සංවර්ධනය සඳහා අවශ්‍ය නවෝත්පාදන, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ සංස්කෘතික උරුමයන් සහ සාම්ප්‍රදායික දැනුම සංරක්ෂණය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1 අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා උපදේශකවරුන් සහ නවක ශිල්පීන් පුහුණු කිරීම.

❖ **පේෂ කර්මාන්ත පුහුණු ආයතන සඳහා පුහුණුලාභීන් බඳවාගෙන පුහුණු කිරීම.**

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂ කර්මාන්ත පුහුණු ආයතන 14 ක් මගින් පවත්වන පේෂ කර්මාන්තය පිළිබඳ සය මාසික මූලික පුහුණු පාඨමාලාව හා මාස 13ක අවසාන සහතිකපත්‍ර පාඨමාලාව තුළින් අදාළ පුහුණුව ලබා දෙයි. මෙම පූර්ණකාලීන පාඨමාලා මගින් සිංහල සහ දෙමළ මාධ්‍ය ඔස්සේ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳව පුළුල් න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙයි.

මෙමගින් අත් යන්ත්‍ර භාවිතයෙන් රෙදි නිෂ්පාදනය සඳහා තාක්ෂණික දැනුම සහිත පුහුණුලාභීන් බිහි කරන අතර අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ අනුමත වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වනු ලබන එකම ආයතනය වනුයේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවයි.

ඒ අනුව 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා පුහුණුලාභීන් 110 දෙනෙකු බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. සුදුසුකම්ලත් පුහුණුලාභීන් 96ක් සඳහා 2025 පෙබරවාරි මස 12 වන දින මෙම පාඨමාලාව ආරම්භ කරන ලදී.

1.3.2 අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත විභාග පැවැත්වීම

❖ **පේෂ කර්මාන්ත අවසාන සහතිකපත්‍ර පුහුණු පාඨමාලා සම්බන්ධ විභාග කටයුතු**

2024/2025 වර්ෂය සඳහා බඳවා ගන්නා ලද පුහුණුලාභීන්ගේ පේෂ කර්මාන්ත අවසාන සහතිකපත්‍ර හා මූලික පුහුණු පාඨමාලාවන්ට අදාළ විභාගය 2025 පෙබරවාරි මස 19, 20 සහ 21 යන දිනයන්හි පවත්වන ලදී.

❖ **අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර පුහුණු පාඨමාලාව සම්බන්ධ විභාග කටයුතු**

මෝස්තර පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා 2024 ඔක්තෝම්බර් මස බඳවා ගන්නා ලද සිසුන් සඳහා පාඨමාලාව අවසානයේ පවත්වන පරීක්ෂණය 2025 ඔක්තෝම්බර් මස 27, 28 සහ 29 යන දිනවල පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරන ලදී. වර්ෂයක පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පාඨමාලාව 2024 වර්ෂයේ අගෝස්තු මස කටුබැද්ද පේෂ කර්මාන්ත පර්යේෂණ මෝස්තර පුහුණු හා සේවා ආයතනයේ දී ආරම්භ කරන ලදී.

1.3.3 ධාරිතා සංවර්ධන සහ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන්

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ එතෙක් පැවති නිෂ්පාදන කාර්යයන්ට අදාළ මධ්‍යස්ථාන පමණක් 1989 වර්ෂයේ දී, පළාත් සභා වෙත පවරා දෙන ලද අතර, වර්තමානයේ පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තු යටතේ අත්යන්ත්‍ර සහ බලවේග විවිධ මධ්‍යස්ථාන සහ එම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා පළාත ඇතුළත අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යයි.

ඒ අනුව, පේෂ කර්මාන්තයේ නියැළෙන පෞද්ගලික අංශය සහ සමුපකාර අංශයේ ශිල්පීන්, ව්‍යවසායකයින් මෙන්ම පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තු යටතේ සේවය කරන පේෂ කර්මාන්ත උපදේශකවරුන් දක්වා විහිදී යන පරිදි පේෂ කර්මාන්තයේ ගුණාත්මක සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ.

කටුබැද්ද පේෂ කර්මාන්ත පර්යේෂණ, මෝස්තර, පුහුණු හා සේවා ආයතනයේ දී අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු පළාත් රාජ්‍ය, සමුපකාර සහ පෞද්ගලික අංශයේ පේෂ කර්මාන්ත පුහුණුකරුවන් සහ ශිල්පීන් සඳහා ධාරිතා සංවර්ධනය සහ කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් 2025 වර්ෂයේදී පුහුණුලාභීන් 155 දෙනෙකු සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් 10ක් පවත්වන ලදී.

තවද, ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් මගින් ක්ෂේත්‍රයේ නියුතුවූවන් 331 දෙනෙකු සඳහා කෙටිකාලීන පුහුණු වැඩමුළු පවත්වන ලදී.

❖ **<u>2025 වර්ෂයේ පවත්වන ලද සේවාස්ථ පුහුණු පාඨමාලා</u>**

අනු අංකය	පාඨමාලාවේ නම	පවත්වන ලද දිනය	පවත්වන ලද දින ගණන	සහභාගී වූ සංඛ්‍යාව	පවත්වන ලද ස්ථානය
1.	කැච්කාඩ් මෝස්තර	2025.01.28	04	15	කටුබැද්ද පේෂ කර්මාන්ත පර්යේෂණ, මෝස්තර, පුහුණු හා සේවා ආයතනය
2.	දුම්බර රටා මෝස්තර	2025.02.05	03	12	
3.	සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ	2025.03.04	04	19	
4.	අත් යන්ත්‍ර ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා	2025.03.11	02	40	
5.	වී ඇට වියමන් මෝස්තර	2025.03.18	04	20	
6.	අත් බෑග් නිර්මාණය	2025.03.24	05	20	
7.	වර්ණ සංයෝජනය	2025.04.28	03	10	

8.	වූල් තුවා	2025.07.15	04	12	
9.	රෙදි වර්ණ ගැන්වීම	2025.10.28	03	12	
10.	ආභරණ සැකසීම	2025.11.21	03	15	

❖ **<u>අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නියැළෙන්නන් සඳහා ක්ෂේත්‍ර පුහුණු වැඩමුළු පැවැත්වීම.</u>**

අනු අංකය	පුහුණු වැඩසටහන	දිනය	පුහුණුව පවත්වන ලද ස්ථානය	පුහුණුව සඳහා සහභාගී වූ ගණන	පුහුණුව පවත්වන ලද දින ගණන
1.	පල්ලු සාරි	2025.03.04	ගාල්ල මහමෝදර රන්සළු ආයතනය	16	04
2.	ස්වභාවික වර්ණ සම්බන්ධ පුහුණුව	2025.03.24	ගාල්ල මහමෝදර රන්සළු ආයතනය	16	05
3.	ලෙනෝ මෝස්තර සම්බන්ධ පුහුණුව	2025.03.10	හම්බන්තොට රන්සළු ආයතනය	12	04
4.	ස්වභාවික වර්ණ සම්බන්ධ පුහුණුව	2025.06.02	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව -මඩකලපුව	27	05
5.	කුකුල් අඩි වියමන් මෝස්තර පුහුණුව	2025.06.02	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව -මඩකලපුව	16	05
6.	ස්වභාවික වර්ණ සම්බන්ධ පුහුණුව	2025.06.11	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව -මඩකලපුව	09	05
7.	වර්ණ සංයෝජන සම්බන්ධ පුහුණුව	2025.06.16	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව -මඩකලපුව	18	05
8.	කාපට් පුහුණුව	2025.06.23	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව -මඩකලපුව	25	07
9.	දුම්බර රටා පුහුණුව	2025.07.01	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව -මඩකලපුව	30	03
10.	වර්ණ සංයෝජන සම්බන්ධ පුහුණුව	2025.07.07	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව -අම්පාර	20	05

11.	වර්ණ සංයෝජන සම්බන්ධ පුහුණුව	2025.06.14	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව -කල්මුණේ	12	03
12.	පල්ලු වියමන් සම්බන්ධ පුහුණුව	2025.08.22	කලල්පිටිය පේෂ කර්මාන්ත ව්‍යාපෘතිය	10	05
13.	ඩොබි පුහුණුව	2025.09.02	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව -අම්පාර	25	07
14.	කැව් කාඩ් පුහුණුව	2025.09.22	උතුරු මැද පළාත	22	04
15.	ස්වභාවික වර්ණ සම්බන්ධ පුහුණුව	2025.10.07	උතුරු මැද පළාත	22	04
16.	වී ඇට වියමන	2025.10.27	උතුරු මැද පළාත- අනුරාධපුර	21	05
17.	රෙදි වර්ණ ගැන්වීම	2025.10.28	කටුබැද්ද පේෂ කර්මාන්ත පර්යේෂණ මෝස්තර පුහුණු හා සේවා ආයතනය	12	03
18.	සැහැල්ලු සෙල්ලම බඩු පුහුණුව	2025.11.03	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගම්පහ	18	05

1.3.4 අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම.

අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැළෙන ශිල්පීන් සඳහා වෘත්තීය සුදුසුකම් පිරිනැමීමේ අරමුණ සහිතව ශිල්පීන් 17 ක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව යටතේ පූර්ව ඉගෙනුම් හඳුනා ගැනීමේ ක්‍රමවේදය (RPL) ඔස්සේ ඇගයීමට ලක් කර ජාතික වෘත්තීය සුදුසුකම් 3 සහ 4 මට්ටම්වල සහතික ප්‍රදානය කරන ලදී.

1.3.5 පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.

- මොරටුව විශ්වවිද්‍යාලයේ විලාසිතා නිර්මාණකරණය පිළිබඳ උපාධි පාඨමාලාව හදාරන සිසුන් හට රෙදි විවීමට අදාළ ප්‍රායෝගික පුහුණු මොඩියුල සඳහා වැඩසටහන් පැවැත්වීම සහ සම්පත් දායකත්වය ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව යටතේ ඇති කටුබැද්ද පේෂ කර්මාන්ත පර්යේෂණ, මෝස්තර, පුහුණු සහ සේවා ආයතනය මගින් සිදු කරනු ලබයි. ඒ අනුව, 2025 වර්ෂයේ දී උපාධි අපේක්ෂිත සිසුන් 70ක් සඳහා මාස 06ක ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම සඳහා පහසුකම් සලසන ලදී.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා විදුලි බලයෙන් ක්‍රියාත්මක වන සාර්ථක නූල් එතීමේ යන්ත්‍රයක් (Electric Warping machine) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ උපදේශකත්වය යටතේ සංවර්ධනය කරන ලදී.

- 2025 වර්ෂයේ දී නව පර්යේෂණ රෙදි සාම්පල 23ක් සිදු කර ඇත. මේ අතරින් සාර්ථක රෙදි නිෂ්පාදන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.
- ස්වභාවික අමුද්‍රව්‍ය භාවිතයෙන් වර්ණ යොදා ගැනීම (Natural dye for yarn dyeing) සහ කපු හා පොලියෙස්ටර් මිශ්‍ර නිෂ්පාදන සාම්පල සිදු කර ඇත. ඒවා ක්ෂේත්‍රයට හඳුන්වා දීම සඳහා පියවර ගනිමින් පවතියි.

1.3.6 සාම්ප්‍රදායික දැනුම ලේඛනගත සංරක්ෂණය

අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සතු සාම්ප්‍රදායික විවීම් ක්‍රමවේද සහ ආවේණික මෝස්තර රාශියක් පවතින අතර දෙපාර්තමේන්තුව විසින් එම ක්‍රමවේද අත්හදා බැලීම, හඳුන්වා දීම සහ ලේඛණගත සංරක්ෂණය සිදු කරනු ලබයි.

එකිනෙකට වෙනස් වූ සාම්ප්‍රදායික විවීම් ක්‍රමවේද සාම්පල 70ක් පමණ සිදු කර ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන්ට පරිහරණය කළ හැකි අත්පොතක් නිර්මාණය කර ඇත.

1.3.7 අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම

වඩාත් ඵලදායී ජීවනෝපාය මාර්ගයක් ලෙස අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාප්ත කරලීමේ අරමුණෙන් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ විවිධ දිස්ත්‍රික් ආවරණය වන පරිදි අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට මූලික කටයුතු කර ඇත.

අදාළ ප්‍රදේශවල තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ මාස හයක පුහුණුව ලබා දීමෙන් පසු කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අත් යන්ත්‍ර උපකරණ හා අමුද්‍රව්‍ය ගිවිසුම්ගත ලෙස ලබා දීමෙන් අනතුරුව පුහුණුව ලද ප්‍රතිලාභීන් කර්මාන්තගත කිරීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව 2025 වර්ෂයේදී ලද ව්‍යාපෘති යෝජනාවලින් එම වර්ෂයේදී ආරම්භ කළ ව්‍යාපෘති තොරතුරු පහතින් දැක්වේ. එමගින් ස්වයං රැකියාලාභීන් 39ක් කර්මාන්තගත කර ඇත.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	දිස්ත්‍රික්කය	පුහුණුලාභීන් සංඛ්‍යාව
1	කලල්පිටිය ව්‍යාපෘතිය (අත්තනගල්ල ප්‍රා.ලේ.කොා.)	ගම්පහ	06
2	එල්ලක්කල ව්‍යාපෘතිය (අත්තනගල්ල ප්‍රා.ලේ.කොා.)	ගම්පහ	03
3	පැලපිටියාගොඩ ව්‍යාපෘතිය (දොඩන්ගොඩ ප්‍රා.ලේ.කොා.)	කළුතර	06

4	කුරුවිට ව්‍යාපෘතිය (කුරුවිට ප්‍රා.ලේ.කොා.)	රත්නපුර	10
5	කිතුලම්පිටිය ව්‍යාපෘතිය (කඩවත්සතර ප්‍රා.ලේ.කොා.	ගාල්ල	05
6	කඹුරුපිටිය ව්‍යාපෘතිය (කඹුරුපිටිය ප්‍රා.ලේ.කොා.)	මාතර	04
7	වදේමඩ ව්‍යාපෘතිය (උකුවෙල ප්‍රා.ලේ.කොා.)	මාතලේ	05
8	සූරියවැව ව්‍යාපෘතිය (සූරියවැව ප්‍රා.ලේ.කොා.)	හම්බන්තොට	02
මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව			**41**

1.3.8. ජාතික අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත රෙදිපිළි තරගය, ප්‍රදර්ශනය හා සම්මාන උළෙල පැවැත්වීම.


අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වෙළෙඳපොළ අරමුණු කොට දේශීය රෙදිපිළි නිර්මාණය කරන අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැළෙන්නන්ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම හා ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා වාර්ෂිකව පවත්වන ජාතික අත් යන්ත්‍ර රෙදිපිළි තරගය පැවැත්වීමට කටයුතු කරන ලදී.

සියලු පළාත්වලට අදාළව තරග අංශ 23ක් යටතේ පළාත් තරග පවත්වා පළාත් මට්ටමේ ජයග්‍රාහී නිර්මාණ ජාතික තරගයට යොමු කර, ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් ජාතික තරගය සඳහා අවසන් නිර්මාණ තෝරා ගැනීමේ කටයුතු 2025.10.24 දින කටුබැද්ද පේෂ කර්මාන්ත පර්යේෂණ,මෝස්තර, පුහුණු හා සේවා ආයතනයේ දී පැවැත්වීමට කටයුතු කරන ලදී. එම තරගයට අදාළව 2025 දෙසැම්බර් මස 12 වෙනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී (BMICH) ජාතික සම්මාන ප්‍රදානෝත්සවය පවත්වන ලදී.

ඉහත ජාතික තරගයේ ජයග්‍රාහී නිර්මාණ ප්‍රදර්ශනය 2025 දෙසැම්බර් මස 12,13 සහ 14 වන දිනවල දී, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පවත්වන ලදී.

අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැළෙන්නන් සඳහා අලෙවි අවස්ථා සහ ව්‍යාපාර සම්බන්ධීකරණ අවස්ථා සලසා දීමේ අරමුණින් 2025 වර්ෂයේදී අප්‍රේල් සහ දෙසැම්බර් මාසවල දී අලෙවි සල්පිල් පැවැත්වීමට කටයුතු කරන ලදී. අප්‍රේල් මස අලෙවි කුටි 54 ක් සඳහා අත් යන්ත්‍ර නිෂ්පාදන අලෙවි පහසුකම් සලසා දෙන ලද අතර එමගින් අලෙවිකරුවන් ලද ආදායම රු.මි.7.9 කි. 2025 වර්ෂයේදී දෙසැම්බර් මස අලෙවි කුටි 60 ක් සඳහා අත් යන්ත්‍ර නිෂ්පාදන අලෙවි පහසුකම් සලසා දෙන ලද අතර එමගින් අලෙවිකරුවන් ලද ආදායම රු.මි.12.6 කි. එමගින් නව ව්‍යාපාර සම්බන්ධතා නිර්මාණය වීම ද සිදුව ඇත.

1.4 සංවිධාන සටහන


අධ්‍යක්ෂ
(ශ්‍රී.ලං.පරි.සේ I)
පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ -02
(ශ්‍රී.ලං.වි.සේ I/II/III)
සහකාර අධ්‍යක්ෂ (පාලන) -01
(ශ්‍රී.ලං.පරි.සේ II/III))
පරිපාලන නිලධාරී - 01
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර - 01
කාර්මික නිලධාරී - 01
(ශ්‍රී.ලං.කා.සේ II)
රියදුරු - 05
කළමනාකරණ සේවා නිලධාරී - 11
මුරකරු - 03
චිත්‍ර ප්‍රදර්ශක - 01
කම්කරු - 05
කා.සේ.සේ. - 06
සංවර්ධන නිලධාරී - 01
අභ්‍යන්තර විගණක -01
(ශ්‍රී.ලං.ග.සේ II/III)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) -01
(ශ්‍රී.ලං.පරි.සේ II/III))
සංවර්ධන නිලධාරී - 39
පේෂකර්ම උපදේශක - 49
කා.සේ.සේ - 03
කම්කරු - 04
මුරකරු - 15
කටුබැද්ද අංශය
පේෂකර්ම උපදේශක - 08
සංවර්ධන නිලධාරී - 03
ගණකාධිකාරී - 01
(ශ්‍රී.ලං.ග.සේ II/III)
සංවර්ධන නිලධාරී - 02
කා.සේ.සේ - 01
කළමනාකරණ සේවා නිලධාරී - 09

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- සංවර්ධන අංශය
- පර්යේෂණ හා සංරක්ෂණ අංශය
- ආයතන අංශය
- ගිණුම් අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

පේෂ කර්මාන්ත පර්යේෂණ, මෝස්තර, පුහුණු හා සේවා ආයතනය
280/1, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.

පේෂ කර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර පුහුණු ආයතන
පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂ කර්මාන්ත පුහුණු ආයතන 14 ක් සහ මෝස්තර පුහුණු ආයතන 2 කි.

අනු අංකය	ආයතනය	ලිපිනය
01	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - කටුබැද්ද	1/280, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.
02	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - කොට්ටල	කොට්ටල, වේයන්ගොඩ.
03	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - බෝයගනේ	බෝයගනේ, කුරුණෑගල.
04	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - පින්නවල	පින්නවල, රඹුක්කන.
05	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - වටපුළුව	අරුප්පල පාර, වටපුළුව, මහනුවර.
06	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - ගැටඹේ	ගැටඹේ, පේරාදෙණිය.
07	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - මාතලේ	කෝන්ගහමුල, පලාපත්වල, මාතලේ.
08	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - මාතර	හක්මන පාර, මාතර.
09	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - කිරම	මිද්දෙනිය පාර, කිරම.

10	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - බණ්ඩාරවෙල	කිණිගම, බණ්ඩාරවෙල.
11	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - තලාව	මිහිරිගම, තලාව.
12	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - ගාල්ල	කලේගාන පාර, ගිංතොට, ගාල්ල.
13	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - නල්ලූර්	194, පේදුරුතුඩුව පාර, නල්ලූර්, යාපනය.
14	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - සමන්තුරේ	සමන්තුරේ.
15	උසස් මෝස්තර පුහුණු ආයතනය - කටුබැද්ද	1/280, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.
16	උසස් මෝස්තර පුහුණු ආයතනය - ගැටඹේ	ගැටඹේ, පේරාදෙණිය.

පරිච්ඡේදය 02 : ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ආයතනයේ ප්‍රගතිය

- 2025 වර්ෂයේ දී මොරටුව විශ්වවිද්‍යාලයේ විලාසිතා නිර්මාණකරණය පිළිබඳ උපාධි පාඨමාලාව හදාරන සිසුන් හට ප්‍රායෝගික පුහුණු මොඩියුල සඳහා අවශ්‍ය සම්පත්දායකත්වය ලබා දෙමින් වැඩසටහන් පැවැත්වීම ආරම්භ කරන ලදී. ඒ අනුව, සිසුන් 70 ක් සඳහා මාස 06 ක ප්‍රායෝගික පුහුණුව ලබාදෙන ලද අතර උපාධිධාරීන්, අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ රඳවා ගනිමින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මෙමගින් අපේක්ෂිතය.

- දෙපාර්තමේන්තුව මගින් පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තු, සමූපකාර හා පෞද්ගලික අංශවල අත් යන්ත්‍ර ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ට අවශ්‍ය වැඩිදුර පුහුණු ලෙස විවීම්/ මෝස්තර/ නිෂ්පාදන සංවර්ධන පුහුණු පාඨමාලා පවත්වනු ලබයි. 2025 වර්ෂයේ සිට ක්ෂේත්‍රගත පුහුණු වැඩසටහන් ප්‍රමාණය වැඩි කිරීම මගින් ශිල්පීන් වැඩි පිරිසක් පුහුණු කර ඇත.

2.2 ආයතනයේ ඉදිරි දැක්ම

- පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා 2026-2030 උපාය මාර්ගික සැලැස්ම සකස් කරමින් පවතියි.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් යාවත්කාලීන කිරීම.
- පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ පුහුණු ශිල්පීන්ගේ හිඟයට පිළියම් යෙදීම සඳහා පියවර ගැනීම.
- නිෂ්පාදන විවිධාංගීකරණ සහ නිෂ්පාදන සංවර්ධන පාඨමාලා හඳුන්වා දීම.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය.
- ග්‍රාමීය මට්ටමෙන් අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්වීම.
- පර්යේෂණ ඔස්සේ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත උපකරණ සහ උපාංග වැඩිදියුණු කිරීම.
- ස්වාභාවික වර්ණ උපයෝගී කරගත් අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හඳුන්වාදීම සඳහා වැඩසටහන් පුළුල් කිරීම.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සංරක්ෂණය සඳහා කටයුතු කිරීම.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදන අලෙවිය සහ ප්‍රවර්ධනය සඳහා පියවර ගැනීම.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය.

2.3 අභියෝග

- ❖ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම.
- ❖ තාක්ෂණික දැනුම සහිත තනතුරු දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලයෙහි නොමැති වීම.
- ❖ ප්‍රමාණවත් ඉඩ හා පහසුකම් සහිත සේවා ස්ථානයක් නොමැති වීම.
- ❖ අනුමතව ඇති සීමිත කාර්ය මණ්ඩලය තුළ ද තනතුරු පුරප්පාඩු පැවතීම.
- ❖ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දිනෙන් දින ඉහළ යාම.
- ❖ අත් යන්ත්‍ර නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් වෙළෙඳපොළ අවස්ථා සම්බන්ධීකරණය අවම වීම.
- ❖ අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනවලට අගය එකතු කිරීමක් සිදු නොවීම සහ විදේශ වෙළෙඳපොළ ඉලක්ක කර නොගැනීම.

2.4 ආයතන ප්‍රධානියාගේ අත්සන



නම : යූ.වී.එස්.සේනානි සෙනෙවිරත්න
තනතුර: පේෂ කර්මාන්ත අධ්‍යක්ෂ

පරිච්ඡේදය 03 :සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය රු.ශත		ඉකුත් වර්ෂය රු.ශත
-	**ආදායම් ලැබීම්**		-		-
-	ආදායම් බදු	1	-		-
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-		-
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-		-
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-		-
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-		-
-	**ආදායම් නොවන ලැබීම්**		-		-
-	භාණ්ඩාගාර අග්‍රිම		166,320,000.00		150,484,000.00
-	තැන්පතු		2,104,872.00		7,665,988.00
-	අත්තිකාරම් ගිණුම්		7,383,368.00		8,450,935.00
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		-
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**175,808,240.00**		**166,600,923.00**
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් (ඇ) = (අ) + (ආ)**		**175,808,240.00**		**166,600,923.00**
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)**		**177,512.00**		**-**
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඉ) = (ඇ) – (ඈ)**		**175,630,728.00**		**166,600,923.00**
-	**අඩු කළා : වියදම**		-		-
-	**පුනරාවර්තන වියදම්**		-		-

103,600,000.00	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	102,382,979.00		82,364,725.00
30,400,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	25,512,933.00		24,285,964.00
226,300,000.00	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	203,904,773.00		208,334,646.00
-	පොළී ගෙවීම්	8	-		-
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-		-
360,300,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**331,800,685.00**		**314,985,335.00**
	මූලධන වියදම්				
27,500,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	25,673,308.00		11,395,349.00
200,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	196,619.00		239,989.00
-	ප්‍රාග්ධන මාරු කිරීම	12	-		-
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-		-
-	හැකියා වර්ධනය	14	-		-
40,000,000.00	වෙනත් මූලධන වියදම්	15	39,557,506.00		40,990,810.00
67,700,000.00	**මුළු මූලධන වියදම (උ)**		**65,427,434.00**		**52,626,148.00**
	තැන්පතු ගෙවීම		2,406,799.00		7,454,760.00
	අත්තිකාරම් ගෙවීම		8,671,286.00		6,484,727.00
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම		-		-
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**11,078,085.00**		**13,939,487.00**
428,000,000.00	**මුළු වියදම** **(එ) = (ඊ +උ +ඌ)**		**408,306,204.00**		**381,550,971.00**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය (ඒ) = (ඉ-එ)		**(232,675,476.00)**		**(214,950,048.00)**
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(232,675,476.00)**		**(214,950,048.00)**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**-**		**-**

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025	2024
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	ඒසිඒ-6	246,692,136	246,495,516
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5	18,488,812	17,200,894
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**265,180,948**	**263,696,410**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		18,218,412	16,628,567
දේපළ පිරියක හා උපකරණ සංචිතය		246,692,136	246,495,516
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ප්‍රංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	270,400	572,327
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		-
මුළු වගකීම්		**265,180,948**	**263,696,410**

පිටු අංක 7 සිට 25 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ සාකෂ්ඨි පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ ඇමුණුම් පිටු අංක 26 සිට 33 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම පත්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිතකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 26/02/26

ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව
සංවර්ධන අමාත්‍යාංශය
73/1, ගාල්ල පාර, කොළඹ 03.

ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :

U.V.S. Senani Seneviratne
Director
Department of Textile Industry
3rd Floor, Secretariat Building,
Maligawatta, Colombo 10.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 26/02/2026

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය	**ඉකුත් වර්ෂය**
	රු. ශත	**රු. ශත**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	11,154,500.00	8,237,986,.00
අග්‍රිම ලැබීම්	166,320,000.00	150,484,000.00
අත්තිකාරම් අයකර ගැනීම	4,807,814.00	4,894,015.00
තැම්පතු ලැබීම්	2,104,872.00	7,665,988.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**184,387,185.00**	**171,281,989.00**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	101,916,604.00	106,305,189.00
සහනාධාර සහ මාරු කිරීම්	211,273.00	1,025,923.00
අනෙකුත් පුනරාවර්තන වියදම්	25,512,933.00	
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරු කිරීම, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	42,926,188.00	
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	6,166,763.00	9,129,576.00
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	177,512.00	229,000.00
අත්තිකාරම් ගෙවීම්	4,872,492.00	4,711,022.00
තැන්පතු ගෙවීම	2,406,799.00	7,454,760.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**184,190,566.00**	**128,855,470.00**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**196,619.00**	**42,426,519.00**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		

පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
අත්තිකාරම් අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)		-
අඩු කළා - මුදල් වැය කිරීම්:		
මූලධන වියදම්	**196,619.00**	**42,655,519.00**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**196,619.00**	**42,655,519.00**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(196,619.00)**	**(42,655,519.00)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	**-**	**(229,000.00)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ)		**(229,000.00)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	**229,000.00**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙළ කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇතිවිට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.00 2002.01.01	**කුලී** රජයේ ගොඩනැගිලි කුලී	800,000.00	800,000.00	1,015,742.58	127%
2002.02.99	**පොළිය -** වෙනත්	750,000.00	750,000.00	710,197.95	95%
2003.99.00	**අනෙකුත් ලැබීම්**	900,000.00	900,000.00	4,153,076.32	461%
2004.01.00 2004.01.00	**සමාජ සංරක්ෂණ දායක මුදල්** මධ්‍යම රජය	3,300,000.00	3,300,000.00	5,275,482.95	159%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	**අවසාන ප්‍රතිපාදනය**		
පුනරාවර්තන	343,000,000.00	360,300,000.00	331,800,686.00	92%
ප්‍රාග්ධන	67,700,000.00	67,700,000.00	65,427,434.00	97%

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන රු.	අවසාන ප්‍රතිපාදන රු.		
149	කර්මාන්ත අමාත්‍යාංශය	රන්සළු අත්කම් ප්‍රදර්ශනය	6,022,500.00	6,022,500.00	6,022,500.00	100%
253	මැතිවරණ දෙපාර්තමේන්තුව	මැතිවරණ රාජකාරී සඳහා නිලධාරීන්ට ගෙවීම් කටයුතුකිරීම	198,126.99	198,126.99	171,195.00	86%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	118,816,125.00	118,816,125.00	-	-
9152 2.1	වාහන	17,350,000.00	17,350,000.00	-	-
9152 2.2	යන්ත්‍රෝපකරණ	24,364,160.63	24,364,160.63	-	-
9153	ඉඩම්	86,161,850.00	86,161,850.00	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/D/DTI/1/2025/51 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2026 මැයි 20 දින

අධ්‍යක්ෂ
පේෂකර්ම දෙපාර්තමේන්තුව

ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 303 - පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ කොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය (සංශෝධිත) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ ඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනු ලබන විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

[illegible]මණ්ඩල සාලභයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, **අභිප්‍රාණෝචිතව** උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය **පිළිබඳව** අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

දෙපාර්තමේන්තුව සතු බලවේග පේෂකර්මාන්තශාලා සහිත ඉඩම් 03 ක් බදු දීමට අදාළව 2025 දෙසැම්බර් 31 දිනට රු. 11,112,250 ක බදු කුලියක් හිඟව පැවතුණි.

3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය	සේවය හැරගිය හා විශ්‍රාමලත් නිලධාරීන්ගෙන් අයවිය යුතු වසර 07 ක කාලයක සිට පැවතෙන රු.1,322,454 ක අයනොවූ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙන නොතිබුණි.
(ආ) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම හා අදාළ කටයුතු ඇගයීම් කිරීමට දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව සඳහා පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කර නොතිබුණි.
(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය (i) 03 ඡේදය	සෑම ඉදිරි වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගත යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම අනුමැතියට ඉදිරිපත් කර තිබුණේ 2025 අප්‍රේල් 05 දින වන අතර 2025 අප්‍රේල් 30 දින අනුමත කරවාගෙන තිබුණි.

(ii) 04 ඡේදය	ඉදිරි වර්ෂයට අදාළ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගත යුතු වුවත් දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කරවාගෙන නොතිබුණි.
(iii) 12.1 ඡේදය	ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2024 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

3.4 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්ය අවසන් කර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද අවස්ථා 03 කදී ලබාදී තිබූ රු. 91,500 ක අත්තිකාරම් පියවීම සඳහා මාස 02 - මාස 3 ½ අතර කාලයක් ගතවී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලඟා කර නොගැනීම

(අ) 2025 වර්ෂය සඳහා සේවස්ථ පුහුණු වැඩසටහන් 20 ක් හා උසස් පුහුණු වැඩසටහන් 05 ක් සැලසුම් කර තිබුණද, 2025 දෙසැම්බර් 31 දිනට සේවාස්ථ පුහුණු වැඩසටහන් 07 ක් හා උසස් පුහුණු වැඩසටහන් 04 ක් පමණක් පවත්වා තිබීමෙන් අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ පේෂකර්ම උපදේශකවරුන් 17ක් සහ පේෂකර්ම තාක්ෂණික විශේෂඥවරයෙකු විසින් පුහුණු වැඩසටහන් 35 ක් පැවැත්වීම සඳහා සැලසුම් කර තිබුණද, වැඩසටහන් 18 ක් පමණක් පවත්වා තිබීම තුළින් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී නොතිබුණි.

(ඇ) 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් 19 ක් ඉටුකිරීම සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 68.95 ක් වූ අතර ඉන් රු.මිලියන 47.6 ක් පමණක් වැයකර ක්‍රියාකාරකම් 16 ක් පමණක් ඉටුකර තිබූ අතර එහි මූල්‍ය කාර්යසාධනය සියයට 69ක් විය.

4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

(අ) පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළ පුහුණු පාසල් 14 ක් ක්‍රියාත්මක වන අතර එම පාසල්වල 2025 වර්ෂයේදී පුහුණුවන සිසුන් 95 ක් සඳහා රු.109,292,890 ක පිරිවැයක් දරා තිබීමෙන් එක් සිසුවෙකු වෙනුවෙන් දරන ලද වියදම රු.1,150,451 ක් විය. පුහුණු වන සිසුන් සඳහා පාසල් 10 ක පවතින වත්කම්වල දළ වටිනාකම රු.274,084,475 ක් වූ අතර අනෙක් පාසල් 04 හි වත්කම් තක්සේරු කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ පවතින වත්කම් හා දරන ලද වියදම් අනුව එක් සිසුවෙකු වෙනුවෙන් ඉහළ ඒකක පිරිවැයක් දරා තිබුණු අතර එම පිරිවැය අවම කර ගැනීමට හා දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රමාණවත් වර්ධනයක් ඇතිකර ගැනීම අවශ්‍ය වුවද, සිසුන් ආකර්ශණය කර ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද පාඨමාලා නවීකරණය නොවීම හා නව තාක්ෂණික ක්‍රම භාවිතා නොකිරීම මෙම පාඨමාලා හැදෑරීමට සිසුන්ගේ අඩු ප්‍රවණතාවයක් පැවතීමට හා මෙම කර්මාන්තය සිසුන් අතර ප්‍රචලිත නොවීමට හේතු වී තිබුණි.

(ආ) අත්යන්ත්‍ර රෙදිපිළි ගම්මාන 07 ක ක්‍රියාත්මක වූ පුහුණු පාඨමාලා සඳහා 2025 වර්ෂයේ පාඨමාලා ආරම්භයේදී පුහුණුලාභීන් 84 ක් සිටියද 2025 දෙසැම්බර් 31 දින වන විට පුහුණුලාභීන් 52 ක් දක්වා අඩුවී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂයේදී පුහුණු උපදේශන දීමනා වශයෙන් රු.652,811 ක් හා පාඨමාලාව සඳහා අවශ්‍ය අත්යන්ත්‍ර, තුල් ආදී ද්‍රව්‍ය සඳහා මුදල් වැයකර තිබුණද, පාඨමාලාවන් සඳහා පුහුණුවන්නන් රඳවා ගැනීමේ සාර්ථක උපාය මාර්ගික වැඩ පිළිවෙලක් සකස් කර නොමැති වීමෙන් පුහුණුලාභීන් 32 ක් ඉවත්ව තිබුණි.

(ඇ) අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයේ නව ස්වයං රැකියා අවස්ථා නිර්මාණය කිරීම උදෙසා පේෂකර්ම ගම්මාන ව්‍යාපෘතිය හරහා අත්යන්ත්‍ර රෙදිපිළි පාඨමාලාව සාර්ථකව නිම කරන පුහුණුවන්නන් හට ස්වයං රැකියා ආරම්භ කිරීමට අමුණකුඹුර ව්‍යාපෘතිය මඟින් 2025 වර්ෂයේ ප්‍රතිලාභීන් 09 දෙනෙකු සඳහා උපකරණ 09 ක් හා මූලික අමුද්‍රව්‍ය ලබාදී තිබුණද ප්‍රතිලාභීන් විසින් කිසිදු නිෂ්පාදනයක් සිදුකර නොතිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබූ යන්ත්‍ර 04 ක් නැවත දෙපාර්තමේන්තුව වෙත රැගෙනවිත් තිබූ අතර ව්‍යාපෘතිය හරහා අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 134 ක් වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට වැටුප් හා දීමනා රු.102,382,979 ක් ගෙවමින් හා ඉහළ ඒකක ශිෂ්‍ය පිරිවැයක් දරමින් නධක්තු වන පුහුණු පාසල්වල පුහුණුව ලබා පිටව යන සිසුන් ප්‍රමාණය ඉතා අඩු මට්ටමක පැවතීම තුළින් රජය විසින් වාර්ෂිකව දරන පිරිවැයට සාපේක්ෂව ලැබෙන ප්‍රතිලාභ අවම වීම නිසා වාර්ෂිකව දරන වියදම ඵලදායී ආයෝජනයක් වී නොතිබුණි.

4.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

මාතලේ බලවේග පේෂකර්මාන්ත ව්‍යාපාර 05 ක් (මාතලේ, ගලේවෙල, අරංගල, වත්තේගම, උකුවෙල) පෞද්ගලික සමාගමකට 99 අවුරුදු පදනමට බදු දී තිබුණි. එම ව්‍යාපාර අවුරුදු 10 -15 ත් අතර, කාලයක් වසා දමා තිබූ අතර මෙම ඉඩම් සඳහා හිඟ බදු මුදල් අයවී නොතිබීමෙන් රජයට අහිමි වී තිබූ ආදායම් රු.108,485,000 ක් විය.

4.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරන පනතේ 47(4) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළයුතු බව දක්වා තිබුණ ද 2026 මැයි 15 දින වන විටත් එම වාර්තාව පිළියෙල කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුව සතුව ඉඩම් හෙක්ටයාර 4.7244 යි පර්චස් 310 ක් පවතින අතර ඒවායේ පුහුණු පාසල් 16 ක් පවත්වාගෙන යනු ලැබුවද පාඨමාලා ඉතා අඩු සංඛ්‍යාවක් පවත්වාගෙන යාම හේතුවෙන් භූමිය භාවිතා කරන සිසුන් ප්‍රමාණය ඉතා අඩු බැවින් එම ඉඩම් ඵලදායී උපයෝජිතව පවතින අතර අතිරික්ත භූමිය ඵලදායී වෙනත් ආයෝජනයක යෙදවීම කෙරේ ආයතනයේ අවධානය යොමුව නොතිබුණි.

(ආ) 2013 ජූලි 12 දිනැති අංක එස්/ඒ/එස්/ඒඒ දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි 12 ක් රජයේ ප්‍රධාන තක්සේරු මණ්ඩල් තක්සේරු කර තිබුණ ද, ඉතිරි ඉඩම් හා ගොඩනැගිලි 04 හි තක්සේරු කටයුතු 2025 නොවැම්බර් 30 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) 2021 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ ප්ලාස්ටික් පුටු 25 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය දක්වාම පියවර ගෙන නොතිබුණි.

(ඈ) පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව හා පුහුණු පාසල්වල පවතින කාර්යාල උපකරණ, පරිගණක උපකරණ, ලී බඩු ඇතුළු වෙනත් යන්ත්‍ර හා උපකරණ අයිතම 99 ක් විනාශ කිරීමටත්, අයිතම 22 ක් විකිණීමටත් 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී නිර්දේශ කර තිබූ නමුත් 2026 අප්‍රේල් දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි. එබැවින් එම අයිතමයන්හි පිරිවැය වටිනාකම් ගිණුම්වලින් ඉවත්ව නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් යටතේ දැක්වුණු වෙනත් යන්ත්‍ර හා උපකරණවල වටිනාකම වූ රු.24,364,161 නිවැරදි නොවුණි.

(ඉ) Lexmark මුද්‍රණ යන්ත්‍ර සඳහා මිලදීගෙන තිබුණු ටෝනර් Cartridge 04 ක් හා HP මුද්‍රණ යන්ත්‍ර Cartridge 02 ක්, පේෂකර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන සඳහා බෙදාහැරීමට මිලදීගෙන තිබුණු හිරමණ 05 ක්, ප්ලාස්ටික් බාස්කට් 03 ක් හා චතුරපෝචිවී 07 ක් නිෂ්කාර්යව ගබඩාව තුළ රඳවා තිබුණි.

4.3 පාඩු හා හානි

ගබඩාව තුළ පැවති කොවිඩ් 19 වසංගත සමයේ ප්‍රයෝජනයට ගැනීම සඳහා මිලදීගෙන තිබුණු ඉවත දැමිය හැකි අත්වැසුම් (Disposable gloves) 700 ක් කල් ඉකුත් වී තිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) සළුසල ආයතනය වෙත විකුණනු ලැබූ කළුතර බලවේග පේෂකර්ම ව්‍යාපෘතියේ අමතර කොටස් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.2,694,443 ක මුදල වාරික 24 කින් සියයට 9 ක පොලියක් සමඟ ගෙවා නිම කිරීමට කොළඹ දිසා අධිකරණය නියෝග කර තිබුණි. ඒ අනුව 1999 ජූලි 01 දින දක්වා රු.702,481 ක ගෙවීමක් හැර ඉතිරි රු.1,991,962ක මුදල හා පොළිය ගෙවීම සළුසල ආයතනය පැහැර හැර තිබුණ ද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) බිබිල නිමිහම් ආයතනය 1996 ජනවාරි 01 දින සිට රු.150,000 ක වාර්ෂික බදු මුදලකට පෞද්ගලික අංශය වෙත බදු දී තිබුණු අතර එහි ව්‍යාපාර කටයුතු සිදු නොකිරීම නිසා 2011 අගෝස්තු 04 දින ඉඩම හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ භාරයට ගෙන තිබුණි. එදිනම ප්‍රාදේශීය ලේකම් වෙත එම දේපළ භාරදී තිබුණු අතර බදුකරුගෙන් අයවිය යුතු රු.1,681,250 ක බදු මුදල අයකර ගැනීමට අදාළව බදු ගිවිසුමේ (e) වගන්තිය ප්‍රකාරව බෙරුම්කරණයට යොමු කර බලාක්මක කිරීම සඳහා බස්නාහිර පළාත් මහාධිකරණයේ නඩු අංක CHC/1110/2023 ARB යටතේ නඩු පවරා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බෙරුම්කරණ කටයුතු සිදුව නොතිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ හා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ නොතිබුණි. අභ්‍යන්තර විගණක තනතුර 2020 ජූලි 14 දින අනුමත වී ඇති නමුත් මේ වන තෙක් තනතුර පුරවා නොතිබූ අතර අභ්‍යන්තර විගණනයක් සිදු කර ද නොතිබුණි.



5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.



එම්.ඩී. සුදර්ශනී අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 : කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

	විශේෂිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
	පේෂ කර්මාන්ත පුහුණු ආයතන මගින් නවක සිසුන් 110 දෙනෙකු පුහුණු කිරීම		√	
	ධාරිතා සංවර්ධනය යටතේ කෙටිකාලීන පුහුණු පාඨමාලා 25ක් පැවැත්වීම	√		
	ග්‍රාමීය මට්ටමේ ස්වයං රැකියා කණ්ඩායම් ව්‍යාපෘති 10ක් ආරම්භ කිරීම		√	
	ග්‍රාමීය මට්ටමේ ශිල්පීන් ඉලක්ක කර ගනිමින් ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම		√	
	ජාතික අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත තරගය, ප්‍රදර්ශනය පැවැත්වීම	√		
	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් 50ක් සඳහා අලෙවි සල්පිල මගින් අලෙවි පහසුකම් සැලසීම සහ නිෂ්පාදන ප්‍රවර්ධනය	√		

පරිච්ඡේදය 05 : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉලක්ක/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50%-74%	75% - 100%
4.4 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම	2030 වසර වන විට අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නවක වෘත්තිකයින් 1000ක් පුහුණු කිරීම	2025 වසර ඇතුළත නවක වෘත්තිකයින් 135 ක් පුහුණු කර ඇත.		√	
9.2 සියලුදෙනාම අන්තර්ගත වන්නා වූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම	2030 වසර වන විට අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නව රැකියා 800ක් ජනිත කිරීම	2025 වසර තුළ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නව රැකියා 85ක් ආරම්භ කර ඇත.		√	

පරිච්ඡේදය 06 :මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	07	04	03
තෘතියික	01	01	0
ද්විතියික	128	101	27
ප්‍රාථමික	42	28	14

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය

- දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරාලීම සඳහා මානව සම්පත් හිඟය දැඩි බලපෑමක් එල්ල කර ඇත. තාක්ෂණික තනතුරුවල මෙන්ම සංවර්ධන නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී ආදී සියලු තනතුරුවල පුරප්පාඩු පවතියි. අභ්‍යන්තර විගණක තනතුර ද පුරප්පාඩුව පවතියි.

- තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරක් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙහි ඇතුළත් නොවන බැවින් තොරතුරු තාක්ෂණ කටයුතු සිදුකර ගැනීමේ දී මහත් අපහසුතාවයන්ට ලක්වීමට සිදුව ඇත.

- තවද, පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්වල යෙදවීමට සුදුසුකම් සහිත නිලධාරීන් දෙපාර්මේන්තුවේ නොමැති අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික තනතුරු ද අනුමතව නොමැත. එම තත්වය ද කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීමේ දී අහිතකර ලෙස බලපා ඇත.

පරිච්ඡේදය 07 :අනුකූලතා වාර්තාව

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය (මු.රෙ.135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක් ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරන මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම.	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව ඇත.	පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර ඇත.
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව ඇත.	පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර ඇත.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව ඇත.	පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර ඇත.

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව ඇත.	පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර ඇත.
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව ඇත.	පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර ඇත.
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා පුරප්පාඩුවක් ඇත	පුරප්පාඩුව පිරවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	**අනුකූලතා තත්ත්වය**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි**	**අනුකූල නොවීම අනාගතයේ දී**

		(අනුකූල වේ/ අනුකූල නොවේ)	පැහැදිලි කිරීම	වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට**

		අනුකූල නොවේ)		යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව ඇත.	පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර ඇත.
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන**

		නොවේ)		නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුව ම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව භාර දී තිබීම	අනුකූල වේ		
	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**

16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරීයෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට**

		අනුකූල නොවේ)		යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		